# අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10/11 ශ්‍රේණි සඳහා වීඩියෝ පාඩම් මාලාවට අදාළ ක්‍රියාකාරකම්**

**10 ශ්‍රේණිය - පරිච්ඡේදය 05 - ගිණුම්කරණ සමීකරණය**

**ව්‍යාපාර ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය**

……………………………………………………………………………………………………..

**01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක i සිට iii දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සිත්රූ විසින් පාසල් බෑග් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් "සිත්රූ බෑග් සෙන්ටර්" නමින් 2020.01.01 දින රු. 150 000 ක ප්‍රාග්ධනයක් යොදා නගරයේ කුලී ගොඩනැගිල්ලක ආරම්භ කළේ ය. 2020.01.05 දින රු. 100 000 ක බැංකු ණයක් ද ලබා ගත්තේ ය. එදිනම ව්‍යාපාරයට සේවකයෙක් ද බඳවා ගන්නා ලදී.

2020 ජනවාරි මාසය තුළ පහත ගනුදෙනු සිදු විය.

| | (රු.) |
|---|---|
| 2021.01.07 බෑග් මිලට ගැනීම | 60 000 |
| 2021.01.08 ලී බඩු මිලට ගැනීම | 20 000 |
| 2021.01.13 බෑග් අත්පිට මුදලට විකිණීම | 35 000 |
| 2021.01.20 බෑග් ණයට විකිණීම | 22 000 |
| 2021.01.25 සේවක වැටුප් ගෙවීම | 15 000 |
| 2021.01.28 සිත්රූ විසින් තම දියණියට බෑගයක් රැගෙන යාම | 3 000 |
| 2021.01.30 ගොඩනැගිලි කුලී ගෙවීම | 4 000 |

i. 2020.01.01 දිනට සිත්රූ බෑග් සෙන්ටර් ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිත ව ලියා දක්වන්න.

ii. 2021.01.05 දිනට සිත්රූ බෑග් සෙන්ටර් ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිත ව ලියා දක්වන්න.

iii. 2021.01.31 දිනට සිත්රූ බෑග් සෙන්ටර් ව්‍යාපාරයේ මුළු වත්කම්, මුළු හිමිකම හා මුළු වගකීම්වල වටිනාකම් වෙන වෙනම ගණනය කරන්න.

**02. නිවැරදි පිළිතුර තෝරන්න.**

1. කුමුදුගේ ව්‍යාපාරයේ 2021.03.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

| වත්කම් (රු.) | = | හිමිකම (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 40 000 | = | 30 000 | + | 10 000 |

2021.03.02 දින සිදු කරන ලද ගනුදෙනුවකට පසු එදිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

| වත්කම් (රු.) | = | හිමිකම (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 37000 | = | 27 000 | + | 10 000 |

2021.03.02 දින සිදු වූ ගනුදෙනුව වන්නේ,

(1). රු. 3 000 ක ආදායමක් ලැබීම ය.
(2). රු. 3 000 ක් ණය හිමියන්ට ගෙවීම ය.
(3). රු. 3 000 ක බැංකු ණය පොලී ගෙවීම ය.
(4). රු. 3 000 ක් ණයගැතියන්ගෙන් ලැබීම ය.

2. පහත සඳහන් ගනුදෙනු අතරින් හිමිකමට බලපෑමක් ඇති **නොකරන** ගනුදෙනුව වන්නේ,

(1). සේවක වැටුප් රු. 5 000 ක් ගෙවීම ය.
(2). කොමිස් ආදායම් රු. 1 000 ක් ලැබීම ය.
(3). රු. 2 000 ක භාණ්ඩ ගැනිලි සිදු කිරීම ය.
(4). රු. 10 000 ක උපකරණ මිලදී ගැනීම ය.

3. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවකි.

**රු. 2 000 ක පොලී ඇතුළත් ව රු. 12 000 ක බැංකු ණය වාරිකය ගෙවීම.**

මෙම ගනුදෙනුව නිසා ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වන්නේ,

(1). වත්කම් පමණක් වෙනස් වේ.
(2). වගකීම් හා හිමිකම පමණක් වෙනස් වේ.
(3). වත්කම් හා වගකීම් පමණක් වෙනස් වේ.
(4). වත්කම්, වගකීම් හා හිමිකම යන සියල්ලම වෙනස් වේ.

4. 2021.05.01 දිනට පවන්ගේ ව්‍යාපාරයේ තොරතුරු කිහිපයක් පහත පරිදි විය.

| | |
|---|---|
| මෝටර් රථ | රු. 40 000 |
| බඩු තොගය | රු. 15 000 |
| ණයගැතියෝ | රු. 20 000 |
| මුදල් | රු. 25 000 |
| ණයහිමියෝ | රු. 18 000 |

මෙම ව්‍යාපාරයේ 2021.05.01 දිනට වත්කම්, වගකීම් හා හිමිකම්වල වටිනාකම් නිවැරදි ව පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1). රු. 58 000, රු. 20 000, රු. 38 000
(2). රු. 100 000, රු. 18 000, රු. 82 000
(3). රු. 98 000, රු. 20 000, රු. 78 000
(4). රු. 60 000, රු. 18 000, රු. 42 000

**03. පැතුම්ගේ ව්‍යාපාරයේ ජූනි මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණයට බලපෑ ආකාරය පහත දැක්වේ.**

| දිනය | ගනුදෙනුව | වත්කම් (රු.) = | හිමිකම් (රු.) + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 2021.06.01 | 1 | බඩු තොගය + 30 000 | | ණයහිමියෝ + 30 000 |
| 2021.06.02 | 2 | මෝටර් රථ + 150 000<br>මුදල් - 150 000 | | |
| 2021.06.03 | 3 | බඩු තොගය - 15 000<br>ණයගැතියෝ + 20 000 | ලාභය + 5 000 | |
| 2021.06.06 | 4 | මුදල් - 17 000 | ණය පොලී - 2000 | බැංකු ණය - 15 000 |

තව ද පැතුම්ගේ ව්‍යාපාරයේ 2021.06.01 දින මුළු වත්කම් රු. 400 000 ක් වූ අතර මුළු වගකීම් රු. 80 000 ක් විය.

අවශ්‍ය වන්නේ;

(අ). මෙහි සඳහන් 1,2,3,4 ගනුදෙනු වටිනාකම් සහිත ව ලියා දැක්වීම.

(ආ). ඉහත ගනුදෙනු සටහන් කිරීමෙන් පසු 2021.06.06 දිනට ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිත ව ලියා දැක්වීම.

**04. නිර්මාල්ගේ ව්‍යාපාරයේ 2021 අප්‍රේල් මාසය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.**

(1). 2021.04.01 රු. 200 000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම.
(2). 2021.04.03 රු. 40 000 ක ලී බඩු උපකරණ මිලදී ගැනීම.
(3). 2021.04.10 රු. 20 000 ක බඩු තොගයක් ණයට ගැනීම.
(4). 2021.04.18 රු. 50 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
(5). 2021.04.26 රු. 10 000 ක බඩු තොගයක් රු. 14 000 කට අත්පිට මුදලට විකිණීම.

අවශ්‍ය වන්නේ;

(අ). ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දී ඇති ආකෘතිය ඇසුරෙන් වටිනාකම් සහිත ව ලියා දැක්වීම.
(පළමු ගනුදෙනුව ඔබ වෙනුවෙන් සපයා ඇත.)

| අනු අංකය | දිනය | වත්කම් (රු.) | | | = හිමිකම (රු.) | + වගකීම් (රු.) | |
|---|---|---|---|---|---|---|---|
| | | ලී බඩු උපකරණ | බඩු තොගය | මුදල් | හිමිකම | ණයහිමියෝ | බැංකු ණය |
| 1. | 2021.04.01 | | | + 200 000 | + 200 000 | | |
| 2. | | | | | | | |
| 3. | | | | | | | |
| 4. | | | | | | | |
| 5. | | | | | | | |

(ආ). 2021.04.30 දිනට ගිණුම්කරණය සමීකරණයේ ශේෂ ගණනය කිරීම.

**05. කසුන්ගේ ව්‍යාපාරයේ මාර්තු මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක බලපෑම ගිණුම්කරණ සමීකරණය අනුසාරයෙන් පහත දැක්වේ.**

| **දිනය** | **වත්කම්** | **=** | **හිමිකම** | **+** | **වගකීම්** |
|---|---|---|---|---|---|
| මාර්තු 1 | වැඩි වීම | = | වැඩි වීම | | |
| මාර්තු 2 | වැඩි වීම<br>අඩු වීම | | | | |
| මාර්තු 4 | අඩු වීම | = | අඩු වීම | | |
| මාර්තු 5 | වැඩි වීම | = | | | වැඩි වීම |
| මාර්තු 6 | අඩු වීම | = | | | අඩු වීම |

මෙම සමීකරණයට අනුව එක් එක් දිනයේ සිදු වූයේ යැයි අපේක්ෂා කළ හැකි ගනුදෙනුවක් බැගින් වටිනාකම් සහිත ව ලියා දක්වන්න.

ඔබගේ පහසුව සඳහා මාර්තු 1 දින සිදු වූයේ යැයි අපේක්ෂා කළ හැකි ගනුදෙනුවක් පහත දක්වා ඇත.
**මාර්තු 1 අයිතිකරු විසින් රු. 100 000 ක ප්‍රාග්ධනයක් යෙදීම.**

**06. පාරමීගේ ව්‍යාපාරයේ 2021 අගෝස්තු මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.**

2021.08.01 රු. 100 000 ක ප්‍රාග්ධනයක් යෙදවීම.
2021.08.05 රු. 30 000 ක භාණ්ඩ තොගයක් මිලදී ගැනීම.
2021.08.08 රු. 50 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
2021.08.12 රු. 15 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
2021.08.14 රු. 10 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 14 000 කට මුදලට විකිණීම.
2021.08.18 රු. 3 000 ක කොමිස් ආදායමක් ලැබීම.
2021.08.21 රු. 6 000 ක භාණ්ඩ තොගයක් රු. 9 000 කට ණයට විකිණීම.
2021.08.25 රු. 2 000 ක ප්‍රචාරණ වියදම් ගෙවීම.
2021.08.30 රු. 5 000 ක බැංකු ණය පියවීම.
2021.08.31 රු. 2 000 ක භාණ්ඩ ගැනිලි සිදු කිරීම.

ඉහත ගනුදෙනු පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයේ දක්වන්න.
(පළමු ගනුදෙනුව ඔබ වෙනුවෙන් සපයා ඇත.)

| දිනය | වත්කම් (රු.) = | හිමිකම (රු.) + | වගකීම් (රු.) |
|---|---|---|---|
| 2021.08.01 | + 100 000<br>(මුදල්) | + 100 000<br>(ප්‍රාග්ධනය) | |

**07. අසේලගේ ව්‍යාපාරයේ 2020 දෙසැම්බර් 01 දිනට පැවති සියලුම වත්කම් හා වගකීම් ශේෂ පහත දැක්වේ.**

| | (රු.) |
|---|---|
| මෝටර් රථ | 600 000 |
| භාණ්ඩ තොගය | 300 000 |
| මුදල් | 100 000 |
| ණයහිමියෝ | 100 000 |
| බැංකු ණය | 300 000 |

2020 දෙසැම්බර් මාසයේ පළමු සතිය තුළ පහත ගනුදෙනු සිදු විය.

1. විකිණීම සඳහා රු. 50 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
2. පිරිවැය රු. 60 000 ක් වූ භාණ්ඩ තොගයක් රු. 100 000 කට අත්පිට මුදලට විකිණීම.
3. වැටුප් සඳහා රු. 20 000 ක් ගෙවීම.
4. රු. 100 000 ක් වටිනා අයිතිකරුගේ මෝටර් රථය ව්‍යාපාරයට යෙදවීම.
5. බැංකු ණය රු. 40 000 ක් පියවීම.

අවශ්‍ය වන්නේ;

(අ).ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම.
(පිළිතුරු සැපයීම සඳහා පහත ආකෘතිය භාවිත කරන්න.)

| ගනුදෙනුව | වත්කම් (රු.) | | | = හිමිකම (රු.) | + වගකීම් (රු.) | |
|---|---|---|---|---|---|---|
| | මෝටර් රථ | භාණ්ඩ තොගය | මුදල් | හිමිකම | බැංකු ණය | ණයහිමියෝ |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |

(ආ). ඉහත ගනුදෙනුවලට පසු 2020.12.07 දිනට පහත අයිතමවල ශේෂ දැක්වීම.

(1). මුදල් (2). හිමිකම

**08.** ඔබ නිවසට ආසන්නයේ ඇති ව්‍යාපාරයක සතියක් තුළ සිදු වූ එකිනෙකට වෙනස් ගනුදෙනු 10ක් හඳුනා ගෙන ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.